# ආගමික අධ්‍යාපනය සහ භික්ෂූන් වහන්සේ

මහාචාර්ය තිලක් කාරියවසම්.

ශ්‍රී ලංකාවාසී බෞද්ධ භික්ෂූන් වහන්සේ සම්බන්ධයෙන් සලකා බලන කල ආගමික අධ්‍යාපනය ඉතා උසස් අන්දමින් ලැබීම, උන්වහන්සේලාට සිද්ධ කළ හැකි විවිධ වූ ආගමික මෙහෙයන් සාර්ථක වීමට විශේෂ පිටිවහලක් වනු නො අනුමාන ය. බෞද්ධාගම හා දර්ශනයට අමතර ව අන්‍ය ආගම් පිළිබඳ හැදෑරීම බෞද්ධ භික්ෂූන් වහන්සේට ඉතාමත් ම අවශ්‍ය වූ අධ්‍යාපනයකි.

ස්වකීය ආගමික අධ්‍යාපනයට අමතරව අන්‍ය ආගමික අධ්‍යාපනයකින් සම්පූර්ණ වන භික්ෂුවක් වේ නම්, උන්වහන්සේගෙන් ශ්‍රී ලංකාවාසී ජනතාවට වන සේවයට අමතර ව ලෝකයේ විවිධ රටවල දැනීම් පිපාසයෙන් පෙළෙමින් සිටින ශාස්ත්‍රලාභීන්ගේ මනදොළ සපිරීමට ද සේවයක් වනු ඇත. ධර්ම ප්‍රචාරය පිළිබඳ විවිධ ක්‍රම සොයමින් සිටින මෙවැනි යුගයක අන්‍යාගමික හා විවිධ සංස්කෘතීන්ට අයත් ජනතාවට ඔවුන්ගේ විශ්වාසයන්ට අනුකූල වන පරිදි ධර්ම සාකච්ඡාවල යෙදීමට භික්ෂූන්ට හැකි වන්නේ උන්වහන්සේ අන්‍යාගමික ඥානයෙන් යුක්ත වූ තරමට ය. මේ හැර විවිධ වූ ජනතාවන්ගේ සිතුම් පැතුම් හැඟීම් තේරුම් ගැනීමට ආගමික අධ්‍යාපනය ඉවහල් වීම විශේෂ වැදගත්කමකින් යුක්ත වන්නේ ය.

## වර්තමාන තත්ත්වය:

මෑත ලංකාවාසී බෞද්ධ භික්ෂූන් බෞද්ධාගම හා දර්ශනය පිළිබඳ ව හැදෑරූ අය පමණක් වූ අතර ක්‍රමානුකූල අධ්‍යාපනයක් ඒ සම්බන්ධයෙන් ද ලබා ඇත්තේ ඉතා සුළු පිරිසකි.

---

1 'පංච මහා වාදය' ප්‍රකාශක ටී. ඇස්. ධර්මබන්ධු, 1956.

සරණංකර සංඝරාජ සමයෙන් පසු ව භාෂා ශාස්ත්‍ර පිළිබඳ ව වැඩි ඇල්මක් දක්වූ බෞද්ධ භික්ෂූහු විද්‍යෝදය හා විද්‍යාලංකාර මහ පිරිවෙන් මගින් ත්‍රිපිටක ධර්මය හැදෑරූහ. මෙසේ ත්‍රිපිටක ධර්මය හැදෑරුවේ ද භාෂාඥානය හා ව්‍යාකරණ ඥානය දියුණු කර ගැනීමේ අභිලාශයෙන් ම ය. ප්‍රාචීන භාෂෝපකාර සමිතිය පිහිටුවීම මගින් සිංහල, පාලි, සංස්කෘත ආදී භාෂා ඥානයට වැඩි තැනක් ලබාදුන් අතර බෞද්ධ අධ්‍යාපනය දියුණු කිරීම සම්බන්ධයෙන් එබඳු ක්‍රියා පරිපාටියක් ද ඇති නො වී ය. භාෂා ඥානය දියුණු කර ගැනීමේ පරමාර්ථයෙන් පාලි ත්‍රිපිටකය හා තදනුගත අටුවා ග්‍රන්ථ පරිශීලනය කිරීම මගින් මෑත කාලයෙහි ධර්මධරයන් බිහිවී ඇත.

නමුත් මෙවැනි යුගයක වුවත් මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමියන් වැනි ප්‍රතිභාපූර්ණ භික්ෂූන්වහන්සේලාගේ උත්සාහයේ ප්‍රතිඵලයක් වශයෙන් බෞද්ධ ධර්මයට, දර්ශනයට අමතර ව කිතු දහම ගැන ද දැනීම් සම්භාරයක් ඇති කර ගෙන තිබුණි. උන්වහන්සේගේ ආගමික ඥානය පිළිබඳ ව අපට දැනගන්නට පුළුවන් වන්නේ ගම්පොල වාදය, පානදුරා වාදය, උදන්විට වාදය හා බද්දේගම වාදය යන විවාද වලදී උන්වහන්සේ විසින් ථෙරවාද ධර්මග්‍රන්ථ වලින් පමණක් නො ව මහායාන ග්‍රන්ථ වලිනුත්, බයිබලයෙන් පමණක් නොව කිතු දහම පිළිබඳ ව බටහිර විචාරකයින් විසින් කරන ලද විවේචන වලිනුත් කරුණු ඉදිරිපත් කර ඇති නිසා ය.

මෙම තත්ත්වය උදාහරණයට ගනිමින් වුවද බෞද්ධ භික්ෂූන් වහන්සේලාට ආගමික අධ්‍යාපනයක් ලබාදීමේ අවශ්‍යතාව වටහාගන්නට ඉඩ තිබුණි. නමුත් එබඳු වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට ප්‍රධාන බාධාවක් වන්නට ඇත්තේ එකල තිබුණු සමාජ වාතාවරණය වන්නට ඇත. නමුත් මේ තත්ත්වය තේරුම් ගත් ක්‍රිස්තියානි පූජකයින් සෑහෙන ප්‍රමාණයක් බුදුදහම පිළිබඳ ව විශේෂයෙන් හදරා ඇත.

බෞද්ධ අධ්‍යාපනය සම්බන්ධයෙන් වුව ද කිසියම් උද්යෝගයක් ඇති වූවා නම් දැනට දශක දෙක තුනක තරම් කාලයක් තුළ ඇති වූ දියුණුවකි. 1942 පේරාදෙණිය විශ්වවිද්‍යාලය පිහිටුවීමෙන් පසුව ප්‍රාචීන භාෂා අංශයට බෞද්ධ



සංස්කෘතිය හා බෞද්ධ දර්ශනය පිළිබඳ පාඨමාලා ඇතුළත් කරන ලද්දේ 1952 දී ය. 1959 යේ විද්‍යෝදය හා විද්‍යාලංකාර විශ්වවිද්‍යාල දෙක ආරම්භ කරන ලද්දේ විශේෂයෙන් බෞද්ධ අධ්‍යාපනයත්, බෞද්ධ සංස්කෘතියත් පුනර්ජීවනයට පත් කරවීම සඳහා ය. ආරම්භයේ දී විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ ඇති කරන ලද පීඨ සතරෙන් එකක් බෞද්ධ ධර්මය පීඨය විය. එහි බෞද්ධ සංස්කෘති අධ්‍යයනාංශය, යනුවෙන් තුනක් ම විය. විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ ද මුලදී ඇති වූ පීඨ හතරෙන් එකක් නම් බෞද්ධ ධර්ම පීඨය යි. එහි බෞද්ධ සංස්කෘති අංශය, බෞද්ධ ධර්ම අංශය හා බෞද්ධ දර්ශන අංශය යනුවෙන් වෙන ම අංශ තුනක් විය. බෞද්ධ අධ්‍යාපනය සඳහා ශිෂ්‍යයන් උනන්දු කරවීම උදෙසා බුද්ධ ධර්මය විශේෂවේදී වශයෙන් හදාරන ශිෂ්‍යයන්ට විශේෂ දීමනාවක් ද විද්‍යෝදය විශ්වවිද්‍යාලය මගින් පිරිනමනු ලැබී ය. එකල ඇති වූ මෙම බෞද්ධ අධ්‍යාපනය පිළිබඳ ප්‍රබෝධයේ ප්‍රතිඵලයක් වශයෙන් මෙම විද්‍යායතනයන් හි පුහුණු වූ අය අද ශ්‍රී ලංකාවේ පමණක් නොව විදේශ විශ්වවිද්‍යාලවල ද අධ්‍යාපන කටයුතුවල නිරතව සිටිති.

මෙයට අමතර ව මෙම විශ්වවිද්‍යාලය දෙකෙහි ම බෞද්ධ පර්යේෂණ ආයතන පිහිටුවා තිබුණි. ආරම්භයේ දී ම ඇති වන මග පෙන්වීම පිළිබඳ දුර්වලතා නැසී වැඩ කටයුතු කිරීමේ වේගය අඩුවීම ස්වාභාවික ය. මුදල් ප්‍රතිපාදනය පිළිබඳ ප්‍රශ්න හේතුවෙන් 1965 දී පමණ එම පර්යේෂණ අංශ වසා දමන ලදී. බෞද්ධ පීඨය බෞද්ධ ධර්ම අධ්‍යයනාංශයක් පමණක් විය. 1966 දී පමණ විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ බෞද්ධ ධර්මය පිළිබඳ පාඨමාලාවට ලෝක ආගම් පිළිබඳ දැනීමක් ලබා දෙන ලදී. මෙය මෙතෙක් කරන ලද ආගමික අධ්‍යාපනයේ නව නැම්මක් ඇතිකිරීමෙහිලා මූලාරම්භයක් විය. එවකට විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ බුද්ධ ධර්මය අධ්‍යයනාංශයාධිපති ව සිටි මහාචාර්ය කොටගම වාචිස්සර හිමිපාණන්ගේ දූර දර්ශී ඥානය මේ සම්බන්ධයෙන් යොමු වීම මෙහි ලා විශේෂයෙන් සිහිපත් කළ යුතු ය.

1972 විශ්වවිද්‍යාලය අධ්‍යාපන ප්‍රතිශෝධන පනතින් බෞද්ධ අධ්‍යාපනය පිළිබඳ අධ්‍යයනාංශ සියලු ම විශ්ව විද්‍යාල වලින් විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයට අනුයුක්ත කොට බෞද්ධ අධ්‍යයනාංශක් මගින් බෞද්ධ සංස්කෘතිය හා බෞද්ධ දර්ශනය යන විෂය දෙක පිළිබඳ ව අධ්‍යාපනය ලබා ගැනීමට සලස්වන ලදී. 1977 දී පශ්චාත් බෞද්ධ පර්යේෂණ ආයතනයක් විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය භූමියෙහි ආරම්භ කරන ලදී. මෙම ආයතනය 1981 දී පාලි හා බෞද්ධ අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය බවට පත්විය.

1983 දී පිහිටුවන ලද බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය බෞද්ධ අධ්‍යාපනය සම්බන්ධයෙන් ශාස්ත්‍රාභිලාශීන් පුහුණු කරවීම සඳහා විශේෂයෙන් පිහිටුවන ලදී. මෙහි ථෙරවාද බුදුදහම හා පාලි භාෂා ඥානය පිළිබඳ ව විශේෂ අවධානයක් ඇතිවන පරිදි පාඨමාලා සකස් කර ඇත.

මෙම කාලය තුළ දී ආගමික අධ්‍යාපනය සම්බන්ධයෙන් ඇති කරන ලද විශේෂත්වයක් නම් ක්‍රිස්තියානි සංස්කෘතිය, හින්දු සංස්කෘතිය, හා ඉස්ලාම් සංස්කෘතිය පිළිබඳ අධ්‍යාපනය ලබා ගැනීමට හැකි වන සේ වෙන වෙනම අධ්‍යයනාංශ පිහිටුවීමයි. විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයෙහි 1976 පටන් ක්‍රිස්තියානි සංස්කෘති පාඨමාලාව ක්‍රමවත් ව ආරම්භ කිරීම නිසා එම විෂය සඳහා ප්‍රථම වරට භික්ෂූන් වහන්සේලා ද සහභාගිවන්නට වූහ. මෙය භික්ෂූන් වහන්සේලාගේ ආගමික අධ්‍යාපනය සම්බන්ධ ඉතිහාසයේ වැදගත් ම සිද්ධියයි.

ශ්‍රී ලංකාවේ වර්තමාන තත්ත්වය ගැන කල්පනා කරන විට බෞද්ධ භික්ෂූන්ට ආගමික අධ්‍යාපනය ලබා දීම විශේෂ වැදගත් කමකින් යුක්ත වන්නේ ය. දැන් ශ්‍රී ලංකාව හඳුන්වනු ලබන්නේ බහු ජාතික බහු ආගමික සමාජයක් (Multi-racial, Multireligious Society) යනුවෙනි. එසේ නම් බෞද්ධ භික්ෂූන් වහන්සේලාට අන්‍ය ආගමික ඥානය අවශ්‍යයෙන් ම තිබිය යුතු බව පැහැදිලි කරුණකි. 1981 ජන සංඛ්‍යා ලේඛනයට[1] අනුව ශ්‍රී ලංකා වාසී මහජනතාව ආගම අනුව කොටස් වන අයුරු මෙසේ පෙන්වා ඇත..

1. ජන හා නිවාස සංගණනයේ ශ්‍රී ලංකාව 1981 සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යංශයේ ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව



| | | |
|---|---|---|
| බෞද්ධ | - | 69.3% |
| හින්දු | - | 15.5% |
| මුස්ලිම් | - | 7.6% |
| කතෝලික | - | 6.8% |
| අනෙක් ක්‍රිස්තියානි | - | .7% |
| වෙනත් | - | .1% |
| | | 100% |

මේ අනුව 30.7% ක් ම විවිධ ආගම්වලට අයත් ජනතාව බව මනාව පෙනේ. එම ආගම් ද ලෝක ආගම් ය. එසේ නම් බෞද්ධ භික්ෂූන් විසින් මෙම ලෝක ආගම් පිළිබඳ ව පෘථුල දැනීමක් ඇති කර ගෙන සිටීම ඉතා ම අවශ්‍ය ය. භික්ෂූන් වහන්සේ අන්‍ය ආගම් ගැන දැනීම් හේතුව මගින් අන්‍යයන්ගේ සිතුම් පැතුම් අනෙක් අයට දැනගන්නට සැලැස්වීම ද උන්වහන්සේලාට ම කළ හැකි ය.

මෙම යුගය ශ්‍රී ලංකාවේ ආගමික පිබිදීමක් ඇති යුගයක් ලෙස සඳහන් කිරීම නිවැරැදි ය. එක් එක් ආගමික ලෝක සම්මේලන කීපයක් ම පවත්වා ඇත. මේ අනුව එක් එක් ආගිමිකයින් තම තමන්ගේ ආගම් පිළිබඳ ව කටයුතු කරනු විනා අන්‍යෝන්‍ය සුහදතාව ආරක්ෂා වන පරිදි විවිධ ආගමිකයින් එක් වේදිකාවට ගෙන ඒමට හැකි වැඩ පිළිවෙලක් ඇති කිරීමට උනන්දුවක් නැත. එබන්දක් කළත් එය ඉතාම අප්‍රසිද්ධ ව කරනු විනා ඒ ගැන මහජනයාට දැනගන්නට හෝ සහභාගිවීමට අවස්ථාවක් ද ලබා දීමට උනන්දුවක් ඇති වී නැත. ජාතික සමගිය පිළිබඳ විශේෂයෙන් ම කරුණු සලකා බලන මෙබඳු කාලයක ජාතීන් අතර අන්‍යෝන්‍ය සුහදතාව ඇති කරවීම සඳහා ඔවුන්ගේ ආගම් හැදෑරීම මාධ්‍යයක් වනු නො අනුමානය.

## අතීත තත්ත්වය:

ක්‍රි :පූ: 6 වන සියවසේ භාරතය ආගමික ප්‍රබෝධය අතින් ඉතා උසස් තත්ත්වයකට පත් වූ යුගයක් විය. සත්‍ය සෙවීමෙහි නිරත වූ බොහෝ පුද්ගලයන් සිටි අතර විවිධ ආගමික මත රාශියක් ඇති වී තිබුණි. ෂට් ශාස්තෘනාමයෙන් ප්‍රධාන, ආගමික නායකයින් සදෙනෙකු සිටි අතර විවිධ වූ දෘෂ්ටීන් දෙසැටක් ගැන බ්‍රහ්මජාල සූත්‍රයෙහි සඳහන් වේ. විවිධ වූ ආගමික ව්‍රතයන් ගැන චූල අස්සපුර[1] සූත්‍රයෙහි සඳහන් වේ. මේ සෑම කෙනෙකු ම පාහේ විවිධ වූ ආගම් පිළිබඳ ව අවබෝධකින් යුක්ත වූ බවට කරුණු හමුවේ. සිද්ධාර්ථ බෝධිසත්වයන් වහන්සේ බොහෝ ආගමික ව්‍රත හදාරා ඒවා අනුගමනය කළ බව මහාසීහනාද මහා සච්චක[2] අරියපරියෙසෙන[3] යන සූත්‍ර වලින් හෙළි වේ. අන්‍යෝන්‍ය ආගම් පිළිබඳ ව තුලනාත්මක ඥානයෙන් යුක්ත වූ ඔවුහු සිය මතයන් පිළිබඳ ව වාද විවාද[4] කරගත්හ. එම ශාස්ත්‍රීය වූ වාද විවාද අවසානයේ ගෞරවාන්විත සිය මතයන් වෙනස් කරගත් අතර ඒ හේතුවෙන් ඔවුනොවුන් විනාශ කර නො ගත්හ. මෑත ලෝක ඉතිහාසයෙහි එබඳු විනාශකාරී තත්ත්වයක් ආගමේ නාමයෙන් ඇති වී තිබේ[5]. එහෙත් අතීතයේ ආගමික වාද විවාද ඉතාමත් බුද්ධිමත් විලාසයෙන් කෙළවර වූ අන්දම පිළිබඳවත් බෞද්ධ භික්ෂූන් ආගමික ඥානයෙන් පරිපූර්ණ ව සිටි බවටත් වැදගත් ආදර්ශයක් මජ්ඣිම නිකායෙහි සන්දක සූත්‍රයෙහි[6] දක්නට ලැබේ.

---

(1) මජ්ඣිම නිකාය 1, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 10, පි.186 - 196.

(2) මජ්ඣිම නිකාය 1, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 10,පි.566-582.

(3) මජ්ඣිම නිකාය 1, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 10,පි.546-554.

(5) 11 වෙනි ශතවර්ෂයේ සිට 14 වෙනි ශතවර්ෂය දක්වා ක්‍රිස්තියානින් සහ මුස්ලිම්වරුන් අතර කුරුස යුද්ධ නවයක් ඇතිවී තිබේ. 16 වෙනි ශතවර්ෂයේ ප්‍රංශයේ ඇති වූ ආගමික විප්ලවයත් මෙබඳු ම කෝලාහලයකි.

The New columbia Encyclopedia, Columbia University press, New York and London, 1975 under Crusades, Religon, wars of, P.690, 2299.

(6) මජ්ඣිම නිකාය II, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, II, පි.308-330.



ආනන්ද හිමියන් සන්දක පරිබ්‍රාජකයාගේ ආශ්‍රමයට ගිය වෙලේ අන්‍ය ශාසනවල ඇති පරස්පර විරෝධිතාව නිසා ඒ ශාසනවල පැවිදි වූ අය වැඩි කල් නොයාදී එම ශාසනවලින් ඉවත් ව යන ආකාරය පිළිබඳ ව පැහැදිලි විස්තරයක් ඉදිරිපත් කරන ලදි. මෙය සාවධාන ව අසා සිටි සන්දක පරිබ්‍රාජකයා සිය සම්ප්‍රදයටත් ආචාර්යවරුන්ටත් ගරහමින් සිය අතවැසියන්ට සර්වඥ ශාසනයට ඇතුළු වන ලෙස දක්වා සිටියේ ය. ආනන්ද හිමියනගේ ප්‍රකාශනය කරුණු සහිත වූවක් නිසා සිය සම්ප්‍රදය උසස් කොට කථා කිරීමක් හෝ පර සම්ප්‍රදායන් පහත් කොට සැලකීමක් හෝ නොවන බව වැඩි දුරටත් සන්දක පරිබ්‍රාජකයා ප්‍රකාශ කෙළේ ය. මේ අනුව අතීතයේ ආගමික සම්ප්‍රදයිකයින් අන්‍ය ආගමික ඥානයෙන් යුක්ත වූ අයුරු පැහැදිලි වන්නේය.

## ආගමික අධ්‍යාපනය වැඩි ගිය අයුරු:

දනට ලෝකයේ ආගමික අධ්‍යාපනය ඉතා ශීඝ්‍රාකාරයෙන් වර්ධනය වෙමින් පවතී. මුල දී බටහිර රටවල පැවතුණේ දේවධර්මය (Theology) හැදෑරීම පමණී. මෙම දේවධර්මවාදීහු ද දේවධර්මය නාමයෙන් ක්‍රිස්තියානි දේවධරර්මය පමණක් හැදෑරූහ. මෑතක් වන තුරු (තවමත්) දේවධර්මය හැර වෙනත් ආගමක් හැදෑරීම බටහිර වැසියන්ට ප්‍රයෝජනවත් නො වන බව විශ්වාස කළ සමහර දේවධර්මවාදීහු සිටියහ. ලෝරන්ස් බ්‍රයිට් නම් ඩොමිනිකානු දේශකයා ක්‍රිස්තියානිය හැර වෙනත් ආගම් හැදෑරීමෙන් බටහිර ජනතාවට ඇති අර්ථයක් නැත. හේතුව බටහිර සංස්කෘතිය ක්‍රිස්තියානිය පදනම් කොට පිහිටි නිසාය.[1] යනුවෙන් ප්‍රකාශ කරයි. මේ ගැන දීර්ඝ විවේචනයක යෙදෙන ට්‍රෙවොලින්ග් ක්‍රි:ව: ආරම්භයේදී ක්‍රිස්තියානි ආගම බ්‍රිතාන්‍යයට පැමුණුනා නම් මධ්‍යධරණී ප්‍රදේශයෙන් පැමිණි අළුත් විශ්වාසයක් නිසා එය ඔවුන්ගේ සංස්කෘතියෙහි මුල් නො බසින්නේ යැයි ප්‍රතික්ෂේප කරන්නට ඉඩ තිබුණායැයි උපහාසාත්මක ව ප්‍රකාශ කරයි.

---

(1) A History of Religion East and West by Trevor ling, P.423.

එහෙත් දැන් දැන් බොහොමයක් විශ්වවිද්‍යාලය වල දේවධර්මය වෙනුවට ආගම් පිළිබඳ ව විවිධ විෂයයන් හැදෑරීමට අවස්ථාව සලසා දී ඇත. මෙසේ ආගම පිළිබඳ ව විවිධ විෂයයන් හැදෑරීමට අවශ්‍යථාව සලසා දී ඇත. මෙසේ ආගම පිළිබඳ ව විවිධ විෂයයන් හැදෑරීමට අවශ්‍යතාව ඇතිවුණේ නූතන ලෝකයේ විද්‍යාව හා තාක්ෂණය

1. ආගමික ඉතිහාසය - History of Religion
2. ආගමික මානව විද්‍යාව - Religions Anthropology
3. ආගමික සංසන්දනය - Comparative Reigioi
4. ආගමික සමාජ විද්‍යාව - Sociology of Religion
5. ආගමික මනෝ විද්‍යාව - Psychology of Religion
6. ආගමික චර්යා විද්‍යාව - Phenomenology of Religion
7. ආගමික දර්ශනය - Philosophy of Religion

මෙම එක් ඒ ශාඛාව පිළිබඳ විවිධ වූ මතභේද ඇතත් මූලික වශයෙන් ආගමික අධ්‍යයනයේ එක්තරා අංශයන්හි විග්‍රහයක් ඉදිරිපත් කරනු ලැබෙන බව පෙනේ. මෙම ශාඛාවන් පිළිබඳ මූලික හැඳින්වීමක් මෙසේ කළ හැකි ය.

**ආගමික ඉතිහාසය:**

මිනිස් චර්යාවේ ආගම පහළ වූයේ කෙබඳු ආකාරයකටද යන්න සොයා බැලීම ආගම් ඉතිහාසයේ මූලික අභිප්‍රාය යි. මේ ගැන විවිධ කරුණු සෙවූ උගතුන් විසින් මත කිහිපයක් පළ කර ඇත.

එනම් ආදි ම මිනිසා ස්වභාවධර්මයේ විවිධ සිදුවීම් දැක ඇති කර ගන්නා ලද බිය මුල් කොට මගින් ආගමික අධ්‍යාපනයට ඇති වන්නා වූ අභියෝගයන්ට මුහුණ දීමක්



වශයෙනි.[1] විවිධ වූ ආගම් හැදෑරීමට ආයතන, විශ්වවිද්‍යාලයවල මුලින් ම පිහිටුවන ලද්දේ ඇමරිකාවේ ය. ඇමරිකාවේ ඉයෝවා (Lova) හා මොන්ටානා (Montana) යන විශ්වවිද්‍යාලයන්ට සම්බන්ධ ආගමික විද්‍යාලයත් සාන්ත බාබරාවේ කැලිෆෝනියා විශ්වවිද්‍යාලයේ (University of Californiya at Santa Barbara) ආගමික අධ්‍යයනාංශයත් (Department of Religious Studies) මේ සම්බන්ධයෙන් මුල් වන්නේ ය.[2] දනට ලෝකයේ විශ්වවිද්‍යාලය සෑහෙන ප්‍රමාණයක මෙවැනි ආගමික අංශ පිහිටුවා ඇත.

අද ආගමික අධ්‍යාපනය නොයෙකුත් අංශ දක්වා විහිදී ඇත. මෙම සෑම අංශයක් මගින් ම මිනිසාගේ ආගමික හැඟීම්වල අවශ්‍යතාව, ඒවා ඇති වූ ආකාරය, ආගමික භක්තිය සාමාජීක වශයෙන් කවර ප්‍රතිඵලයක් ගෙන දෙන්නේ ද යන කරුණු පිළිබඳ ව විග්‍රහයක යෙදේ. එවැනි ශාඛා මෙසේ නම්කර ඇත.[3] ආගම ඇති වූ බවත්, විශ්වයේ ක්‍රියාකාරිත්වය වටහා ගැනීමට යත්න දැරූ ආදිත්ම මිනිසා දෙවිදේවතාවුන් හා යක්ෂභූතයින් පිළිබඳ විශ්වාසය ඇති කරගත් බවත් ප්‍රකාශ කළ අතර තවත් සමහරු ආගම පහළ වූයේ ජීවිතය හා මරණය සම්බන්ධයෙන් ඇතිවන ගැටළු නිරාකරණය කිරීමට තැත් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ය යනාදි මත ද පහළ කළහ. මෙසේ ආගමේ ඉතිහාසය සොයන්නට යෑමේ එක් ප්‍රතිඵලයක් නම් ආගම පහළ වීමේ පොදු මූලකාරණයක් සොයාගැනීමට නො හැකිවීම යි. භක්තිය මුල්වීම හෝ බිය සහගත හැඟීම් මුල්වීම් පමණක් ම ආගම පහළවීමේ මූලකාරණය ලෙස පිළිගැනීම ඉවත් වී විවිධ සමාජ වල ආගම පහළ වූ විවිධ ආකාරය හැදෑරීම පිළිබඳ පුළුල් විෂයයක් ලෙස ආගමික ඉතිහාසය ව්‍යාප්ත විය.

---

(1) Encyclopeadia of Britannica. Vol. 15;p.646.
(2) Encyclopeadia of Britannica. Vol. 15;p.646.
(3) Encyclopeasia of Britannica. Vol. 15;p.613.

**ආගමික මානව විද්‍යාව:**

ආගමික ඉතිහාසය සොයා බැලීමේදී එක් සත්‍යයක් හෙළි විය. එන්ම් මිනිසාගේ ආගමික චර්යාව මිනිසා මෙලොව පහළ වූ ද පටන් ම පැවතුණ බවයි. ඒ අනුව ආගමේ පරිණාමයත් මිනිසාගේ පරිණාමයත් එක හා සමාන කොට හැදෑරීම වැදගත් බබව තේරුම් ගන්නට විය. මෙය ආගමික මානවවිද්‍යාවේ ආරම්භය යි. මේ අනුව ආදිකාලීන මිනිසාගේ ආගමික චාරිත්‍ර සොයා බැලීම සඳහා පැරණි ශිෂ්ටාචාර පැවතුණු තැන් සොයා පුරාවිද්‍යා කැනීම් මගින් තොරතුරු සෙවීමත් දනට ඉතිරි වී ඇති තවමත් ම්ලේච්ඡ ලෙස ගණන් ගැනෙන නො දියුණු ගෝත්‍රිකයින්ගේ චාරිත්‍ර වාරිත්‍ර සොයා බැලීමත් ය.

**ආගමික සංසන්දනය:**

එක් ආගමක් තවත් ආගම් සමග සම්බන්ධ කරමින් හැදෑරීම ආගම් සංසන්දනය යි. මෙසේ තමන් කැමති ආගමක් තවත් ආගමක් හෝ ආගම් කිහිපයක් සමග හෝ හැදෑරිය හැකි ය. මෙසේ සංසන්දනාත්මක ව ආගම් හැදෑරීම ආරම්භ වූයේ මෑතක නොවේ. බොහෝ දුරට ආගම් සංසන්දනය කර ඇත්තේ ඒවායේ ඇති ලක්ෂණ හඳුනා ගැනීමේ පරමාර්ථයෙන් ම නොවේ. බොහෝ දුරට තම තමන් අදහන ආගම් උසස් කර දැක්වීම සඳහා ය.[1] එහෙත් ඉතාමත් ම මෑතකදී බොහෝ උගතුන් විසින් ආගම්වල සංසන්දනය කළ හැකි මූලික කරුණු ඇතුළත් ව ඇති බව සලකන ලදී. බොහෝවිට මුළුමනින් ම ආගමක් තවත් ආගමක් හා සංසන්දනය කළ නො හැකි දෙයක් වන අතර එම ආගම්වල පොදු ලක්ෂණ ඇති බව තේරුම් ගැනීමට මෙම ආගමික සංසන්දනය උපයෝගි වී ඇත.

---

(1) 50Key words, Comparative Religion, by Eric J. Sharp p. 10 සිංහල විශ්වකෝෂය II, පි.411.



**ආගමික සමාජ විද්‍යාව:**

මෙය ආගම් අධ්‍යයනය පිළිබඳ විශේෂ ශාඛාවකි. මෙයින් සලකා බලනු ලබන්නේ ආගමක් සමාජයේ ක්‍රියාකාරිත්වයට කෙතෙක් දුරට බලපාන්නේ ද යන මෙම කරුණයි. මෙයින් බොහෝ දුරට ආගමක් ම ගින් මිනිසා සමාජයට බද්ධ කරන බව සමාජ විද්‍යාඥයින් විසින් තේරුම් ගෙන ඇත. මෙම බද්ධ කිරීම සමාජීකරණය (Socialization) යනුවෙන් හඳුන්වනු ලබන අතර, මේ සඳහා ඒ ඒ ආගම්වල විවිධ ආගමික වත් පිළිවෙත් හා වෙනත් ක්‍රම අනුගමනය කරනු ලැබේ. මෙසේ සමාජයට බද්ධ කරගැනීමෙන් ඔහු සමාජයේ අවශ්‍ය වූ සමාජිකයකු වන අතර ඔහු ඒ මගින් ආත්මාභිමානයක් ද ඇති කරගනු ලැබේ. පුද්ගලයකුගේ ජීවිතයේ ඉදිරි ගමන සඳහා මෙම අභිමානය ඉතා-වැදගත් වන බව සඳහන් කරනු ලැබේ.

**ආගමික මනෝවිද්‍යාව:**

ආගමික අදහස් චින්දන, මානසික අදහස්වලට චින්දනලට සමාන නිසා ඒවා පිළිබඳ ව මනෝවිද්‍යාත්මක ව සොයා බැලිය හැකි ය. මේ අනුව ආගමේ ආරම්භයට මානසික හේතුන් බල පා ඇති අයුරු පිළිබඳ ව සිග්මන් ෆ්‍රොයිඩ් නම් මානසික විද්‍යාඥයා පෙන්වා දී ඇත. ඔහුගේ මතය අනුව ආදිකාලීන මිනිසාගේ ආත්ම චෝදනාත්මක හැඟීමක් ආගමේ ප්‍රභවයට හේතු වී ඇත. සිය ගෝත්‍රික නායකයා මැරීමේ වරද නිසා පීතෘ ඝාතක ආත්ම චෝදනාව ඇති වූ බවත් එයින් මිදීම සඳහා කරුණාවන්ත දෙවියකුගේ භක්තිය ලැබීමට උනන්දු වූ බවත් පෙන්වා දෙයි. එහෙත් ෆ්‍රොයිඩ්ගේ මතය දේවවාදී ආගම් සමග ගැළපුණත් ද්වාදී විශ්වාසයක් නොමැති ථෙරවාදී බුදුදහම සමග ගැළපෙන්නේ නොවේ.[1]

ආගමික මනෝවිද්‍යාවේ පුරෝගාමියා ලෙස සලකන විලියම් ජේම්ස් (William James) ආගම මිනිසාගේ මානසික දියුණුව හා චරිත වර්ධනයට උපයෝගී වන ආකාරය පිළිබඳ

---

(1) Encycloaedia of Britannica, under psychology of Religion.

කරුණු පහදා ඇත. මෙම කරුණ බුදුදහම මගින් ද පිළිගන්නා අතර මේ අනුව බෞද්ධ මනෝවිග්‍රහයත්, මනෝ විශ්ලේෂණ වාදයත් අතර සමාන කමක් ඇති බව මනෝ විද්‍යාඥයින් විසින් පිළිගනු ලැබේ.

**ආගමික චර්යා විද්‍යාව:**

ආගමික චර්යා විද්‍යාව ආගම් සංසන්දනය කිරීම තුළ වර්ධනය වූ නවීන ආගමික විද්‍යාවකි. මෙම විෂයේ විග්‍රහ කරන්නේ ආගමික චර්යාවන් තුළ දක්නට ලැබෙන පොදු ලක්ෂණයෝ ය.

ආගමික චර්යා විද්‍යාව මගින් ආගම්වල පොදු ලක්ෂණ වශයෙන් පෙනෙන වැඳුම්, පිදුම්, ගැයුම්, යැදුම් ආදී ක්‍රියාවන් ගැන පරීක්ෂා කරන්නේ ඒවායේ ඇතුළාන්ත තත්ත්වය ගැන පරීක්ෂා කිරීම සඳහා ය. මේ අනුව ඕනෑම ආගමිකයෙකුගේ බාහිර චර්යාව ඔහුගේ ඇතුළාන්ත හැඟීමක් ප්‍රකාශ කිරීමක් බව පෙන්වනු ලැබේ. මෙයින් ඉස්මතු වන වැදගත් කරුණක් නම් එක් එක් ආගමිකයාගේ ආගමික චර්යාව වෙනස් වුවත් ඒවායේ ගම්‍යත්වය අනුව ඒවාට පොදු පදනමක් ඇති බව යි. උදාහරණයක් වශයෙන් සෑම ආගමක ම පාහේ දේවලෝක, යක්ෂලෝක, ලෞකික, ලෝකෝත්තර වශයෙන් ලෝක දෙකක් පිළිබඳ ව විශ්වාසයක් දක්නට ලැබේ. මෙහි අර්ථය නම් පූජ්‍යත්වය හා අශුද්ධත්වය පිළිබඳ මිනිස් සිතේ මූලාවබෝධය යි.

**ආගමික දර්ශනය:**

දාර්ශනිකයකුගේ ඇසින් අපක්ෂපාතී ව ආගම් දෙස බලා විග්‍රහ කිරීම ආගමික දර්ශනයේ පරමාර්ථය යි. මෙම ආගමික දර්ශනයේදී සලකා බලනු ලබන කරුණු මෙසේ සම්පිණ්ඩනය කළ හැකි ය.

ආගමික අනුභූතියේ ස්වභාවය හා විශ්ලේෂණය, ආගමේ ස්වභාවය, ආගම සහ විද්‍යාව අතර ඇති සම්බන්ධය, ආගමිකභක්තියේ ස්වභාවය, එළිදරවු කිරීමේ ස්වභාවය (The Nature of Revelation) මානුෂික අනුභූතියේ ප්‍රතිඵලයන්ට එහි



ඇති සම්බන්ධය. මනුෂ්‍ය සංස්කෘතිය සමස්තයක් වශයෙන් ගත් විට එය තුළ ආගමට ලැබෙන තැන, ආගමික භාෂාව පිළිබඳ තර්කානුකූල විග්‍රහය, ආගමික සංකේත පිළිබඳ ස්වභාවය සහ විශේෂ ලක්ෂණ යනාදි ය යි. මේ අනුව ආගමික දර්ශනය මගින් ගැඹුරු ලෙස ආගම් පිළිබඳ දාර්ශනික ප්‍රශ්න සාකච්ඡා කරනු ලැබේ.

මෙසේ ආගමික අධ්‍යාපනය ඉතා පුළුල් ආකාරයෙන් දියුණු වී ඇති අතර දිනපතා එය වර්ධනය වෙමින් ද පවතී. නූතන ලෝකයේ විද්වතුන් ආගම දෙස බලන්නට නැඹුරු වන්නේ ඉහතින් දක්වූ ආකාරයට විග්‍රහාත්මක වශයෙනි. එසේ නම් භික්ෂූන් වහන්සේ විසින් මේ පිළිබඳ ව මනා අවබෝධයකින් සිටිය යුතු ය.

**දියුණු කළ හැකි ආකාරය:**

ශ්‍රී ජයවර්ධනපුර, කැලණිය, පේරාදෙණිය ආදී විශ්වවිද්‍යාලවල ඇති පාලි හා බෞද්ධ අංශත්, බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයත්, අනුරාධපුර බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලයත්, පාලි හා බෞද්ධ පශ්චාත් උපාධි ආයතනයත්, යාපනයේ ඇති හින්දු සංස්කෘතිය පිළිබඳ අංශයත්, පේරාදෙණියේ ඉස්ලාම් සංස්කෘතික අංශයත්, කැලණිය විශ්වවිද්‍යාලයේ ක්‍රිස්තියානි සංස්කෘතික අධ්‍යාපනාංශයත් දැනට අන්‍යෝන්‍ය වශයෙන් සහයෝගීත්වයෙන් කටයුතු කිරීමක් නැත. එහෙත් මෙම අධ්‍යයනාංශවල කිසියම් අන්‍යෝන්‍ය සුහදත්වයක් හා සහයෝගීත්වයක් ඇති වන්නේ නම් ශ්‍රී ලංකාවේ ආගමික අධ්‍යාපනය උසස් තත්ත්වයකට දියුණු කළ හැකි වේ. මේ සඳහා මෙම අංශ එකමුතු කිරීමක් අවශ්‍ය නො වේ. අවශ්‍ය වන්නේ සුහද හමුව හා අන්‍යෝන්‍ය සහයෝගයත්, දැනීම් බෙදා හැරීමත් ය. එසේ වන්නේ නම් ප්‍රතිඵලදායි අනාගත ක්‍රියාදමයක් සඳහා ඉදිරි පියවරක් තැබිය හැකි වන අතර මෙම ආයතනවල අධ්‍යාපනයෙහි නිරතවන භික්ෂූන් වහන්සේලාට එමගින් මහඟු ප්‍රයෝජනයක් අත් කර ගත හැකි ද වේ.